සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 2025
# Second Term Test - 2025

**11 ශ්‍රේණිය** | **ශිල්ප කලා - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ලබා දී ඇති වරණ අතුරින් ප්‍රශ්නයට වඩාත් ගැලපෙන පිළිතුර සහිත වරණය තෝරා ලබා දී ඇති පිළිතුරු පත්‍රයේ (x) ලකුණ යොදන්න.

01. ලාංකේය සිව්සැට කලාවේ එක් ප්‍රභේදයක් වන බුද්ධිමතුන් අතින් පෝෂණය වූ කලාව හඳුන්වන්නේ,
   (1) ජන කලාව ලෙසය. (2) දෘශ්‍ය කලාව ලෙසය
   (3) ශ්‍රව්‍යදෘශ්‍ය කලාව ලෙසය (4) විදග්ධ කලාව ලෙසය

02. රජ මැඳුරු අලංකරණයට, පන්සල් ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට හා ප්‍රභූන්ගේ පරිහරණයට අවශ්‍ය නිර්මාණ ආදිය නිපදවීම සඳහා යොදාගත් ජන කලා කර්මාන්තයක් වන්නේ,
   (1) පන් හා කෙඳි කර්මාන්තය (2) බීරලු රේන්ද කර්මාන්තය
   (3) ලාක්ෂා කර්මාන්තය (4) ස්වර්ණාභරණ කර්මාන්තය

03. පහත රූපය අයත් වන්නේ,
   1. තල ජ්‍යාමිතියට ය.
   2. ඝන ජ්‍යාමිතියට ය.
   3. තල වාස්තු ජ්‍යාමිතියට ය.
   4. ඝන වාස්තු ජ්‍යාමිතියට ය.



04. පැන්සලක සටහන් කර ඇති H අක්ෂරයෙන් සංකේතවත් කරනු ලබන්නේ කුමක් ද?
   (1) මිනිරන් කූරේ මෘදු ගතිය. (2) මිනිරන් කූරේ පිටි ගතිය.
   (3) මිනිරන් කූරේ තද ගතිය. (4) මිනිරන් කූරේ දිලිසෙන ගතිය.

05. රූපයේ දැක්වෙන්නේ කොටසක් ආහාරයට ගන්නා ලද කේක් නිර්මාණයකි. මෙහි ආහාරයට ගත් කොටස සමාන වන්නේ වෘත්තයක කුමන කොටසට ද?
   (1) කේන්ද්‍රික ඛණ්ඩයට ය.
   (2) වෘත්ත පාදයට ය.
   (3) පරිධියට ය.
   (4) අර්ධ වෘත්තයට ය.



06. වර්ණ ආලේපකරණයේ දී තුනී පාරදෘශ්‍ය සායම් පදාසයක් ආලේප කිරීම හඳුන්වනු ලබන්නේ,
   (1) සේදුම (2) යටි ආලේපනය
   (3) අඳුරුකරණය (4) අධි ආලෝකකරණය

07. රෙදිපිළි අලංකරණයට පෙර පෙර පිරියම් කළ යුතුය. පෙර පිරියම් ක්‍රමයක් නොවන්නේ,
   (1) කාබනීකරණය (2) වර්ණ ගැන්වීම
   (3) මලහරණය (4) කැඳ හරණය

08. පහත රූප සටහන් අතරින් ඉලිප්සය යොදා ගනිමින් කර ඇති නිර්මාණය කුමක් ද?



A B C D

(1) A (2) B (3) C (4) D

09. රූපයේ දැක්වෙන්නේ රෙදි පින්තාරු තීන්ත යොදා ළමා ඇඳුමක නිර්මාණය කරන ලද රූප සටහනකි. මෙම නිර්මාණය සිදු කිරීමට වඩාත් උචිත ක්‍රමවේදය කුමක් ද?



(1) පින්තාරු ක්‍රමය
(2) ස්ටෙන්සිල් ක්‍රමය
(3) ගැටපඬු ක්‍රමය
(4) පැච්වර්ක් ක්‍රමය

10. ස්වභාවික කෙඳි අතර 'හණ' කෙඳි සඳහා ප්‍රධාන තැනක් ලැබේ. හණ කෙඳිවල ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?

(1) කඳ කොටස් පෙඟවීමෙන් කෙඳි වෙන් කර ගනී.
(2) කෙඳි ඉතාමත් දිලිසෙන ගතියෙන් හා ශක්තිමත් බවින් යුක්තය.
(3) මෙම කෙඳිවලින් වියන රෙදි ලිනන් නමින් හැඳින්වේ.
(4) මෙම කෙඳි කල්පැවැත්ම අතින් දුර්වලය.

11. ''මෝහෙයාර්'' නමින් හඳුන්වන ලෝම ලබා ගන්නා සත්ත්වයා වන්නේ,

(1) ඔටුවා ය. (2) ඇංගෝරා එළුවා ය. (3) ලාමා ය. (4) ඇල්පකා ය.

12. රූප සටහනේ දැක්වෙන්නේ අන්වීක්ෂීය පරීක්ෂාවේ දී පෙන්නුම් කෙරෙන හරස් කඩ පෙනුමකි. මෙම හරස් කඩ පෙනුමෙන් දැක්වෙන කෙඳි වර්ගය කුමක් ද?



(1) සාමාන්‍ය කපු වේ.
(2) ඔප දමන ලද කපු වේ.
(3) විස්කෝස් වේ.
(4) සේද වේ.

13. මුලින් දී ඇති වියමන් රටාවට නොගැලපෙන ලක්ෂණය ඇතුළත් වරණය වන්නේ මින් කුමක් ද?

(1) චාම් වියමන - පොල් අතු, මලු, පැදුරු විවීමට යොදා ගනී.
(2) ජටා වියමන - බාස්කට්, හොප්සැක්, පැහි නමින් හඳුන්වයි.
(3) දික්දාර වියමන - හරස් නාරටි වියමන ලෙස ද හඳුන්වයි.
(4) හරස්දාර වියමන - හරස් අතට දාරයක් මතු වී පෙනේ.

14. පාෂාණ ජීර්ණය වීම සඳහා බලපාන ස්වභාවික හේතුවක් නොවන්නේ මින් කුමක් ද?

(1) සූර්ය තාපය (2) වර්ෂාව
(3) විදුලි කෙටීම (4) කෘෂි කාර්මික කටයුතු

15. භාණ්ඩ නිර්මාණය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය අතර මැටි ප්‍රධාන තැනක් ගනී. මැටි හා සම්බන්ධව දැක්වෙන පහත ප්‍රකාශ තුළින් නිවැරදි ප්‍රකාශ ඇතුළත් පිළිතුර වන්නේ,

A මාතෘ පාෂාණය ෆෙලිස්පාර් දිරාපත් වීමෙන් මැටි නිර්මාණය වේ.

B මැටිවල රසායනික නාමය ඇලුමිනා සිලිකේට් ය.

C මැටි භාණ්ඩ අව්වේ තබා වියළීමෙන් දිගු කල් භාවිතා කළ හැක.

D පිහිටි මැටි, අගම් මැටි ලෙස මැටි ප්‍රධාන ප්‍රභේද දෙකකි.

(1) ACD (2) ABD (3) ABC (4) BCD

16. පදම් කරගන්නා ලද මැටි භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය අවස්ථාව වන තෙක් මැටි පෙට්ටියේ හෙවත් මැටි ඔරුවේ ගබඩා කර තබයි. මැටිවල තෙතමනය රැක ගැනීමේ පරමාර්ථයෙන් මැටි පෙට්ටියේ ඇතුළත ආවරණ කර ඇත්තේ කුමන තහඩුවකින් ද?

(1) සින්ක් තහඩුවකිනි. (2) කොපර් තහඩුවකිනි.

(3) ඇලුමිනියම් තහඩුවකිනි. (4) ලෝහ තහඩුවකිනි.

17. නොඇලෙන සුළු අමුද්‍රව්‍ය පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) කෙඔලින් මැටි, සිලිකා වැලි, ක්වාට්ස්, රතු මැටි

(2) බෙන්තොනයිට්, ෆෙලිස්පාර්, ක්වාට්ස්, ඩොලමයිට්

(3) ක්වාට්ස්, ඩොලමයිට්, ග්‍රොග්, බෝල මැටි

(4) ක්වාට්ස්, සිලිකා වැලි, ඩොලමයිට්, ෆෙලිස්පාර්

18. 

රූපයේ දැක්වෙන මෙවලම් භාවිතා කරනු ලබන්නේ,

(1) තහඩු ක්‍රමයට මැටි භාණ්ඩ නිර්මාණයේදී ය.

(2) ඇඹීමේ ක්‍රමයට මැටි භාණ්ඩ නිර්මාණයේ දී ය.

(3) අච්චු ක්‍රමයට මැටි භාණ්ඩ නිර්මාණයේ දී ය.

(4) වාත්තු ක්‍රමයට මැටි භාණ්ඩ නිර්මාණයේ දී ය.

19. මූර්තියක තිබිය යුතු වැදගත් අංගයක් ලෙස සංරචනය (composition) හැඳින්විය හැක. සංරචනය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(1) සැකිල්ල ඉදි කිරීම (2) හැඩතල මනා ලෙස ගැලපීම

(3) දළ සටහන ඇඳීම (4) පෘෂ්ඨයේ ස්වභාවය

20. මැටි තහඩු භාවිතා කර භාණ්ඩ නිර්මාණ කිරීමේ දී මැටි තහඩු සැකසීමට භාවිතා කළ හැකි යන්ත්‍රය වන්නේ,

(1) රෝලර් ක්‍රෂර් (2) ෆිල්ටර් ප්‍රෙස් (3) ස්ලැබ් රෝලර් (4) ජෝ ක්‍රෂර්

21. මැටි දරණු මගින් රවුම් හැඩය සහිත භාණ්ඩයක් සැකසීමේ දී ආධාර කර ගත හැකි සුදුසුම උපකරණය කුමක්ද ?

(1) සකපෝරුව (2) සිලින්ඩරය (3) බමර රෝදය (4) දැති රෝදය

22. පැච්වර්ක් නිර්මාණ අලංකාර කිරීමට යොදා ගත හැකි රූපයේ දැක්වෙන මැහුම් ක්‍රමය කුමක් ද?



(1) කතිර මැස්ම (2) හුරුළු කටු මැස්ම

(3) ප්‍රිස්මේන්තු මැස්ම (4) නූල් දිවවීම

23. මිනිසා තම ඇඳුම් පැළඳුම් හා ගෘහ උපාංග සකස් කිරීමේ දී පබළු භාවිතා කර ඇත. මානව ශිෂ්ටාචාරයේ ආරම්භය දක්වාම මෙම පබළු භාවිතය විහි දී ඇති බවට දැක්වෙන සාධක හමුවන්නේ,

(1) ඊජිප්තු පිරමීඩවලිනි (2) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙනි

(3) හොවැංහෝ ශිෂ්ටාචාරයෙනි (4) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙනි

24. ගෙතීමේ ක්‍රමයට විවිධ ඇඳුම් පැළඳුම් අලංකාර කරයි. ළදරු තොප්පිය ගෙතීමේ පළමු පියවර වන්නේ,

(1) කුකුළු ගෙතුම ගෙතීම (2) දම්වැල් හතරක් ගොතා මුදුවක් සෑදීම

(3) පිරවිලි දෙකක් යෙදීම (4) පොප් කෝන් ගෙතුම ගෙතීම

25. සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණය කිරීම සඳහා වයනයෙන් යුතු රෙදි වර්ග භාවිතා කරයි. ඊට යොදා ගන්නා රෙදි වර්ගයක් නොවන්නේ මින් කුමක් ද?

(1) බෝවා (2) වෙල්බෝවා (3) ෆෙල්ට් (4) පොලිෆීල්

26. පේපර් ක්විලින් ඇසුරෙන් විවිධ නිර්මාණ සිදු කරයි. මෙහි එක් පියවරක් වන කඩදාසි පටි රෝල් කර ගැනීමට ටූලය වෙනුවට භාවිතා කළ හැකි අනුයෝගී උපකරණය වන්නේ,

(1) ට්විසරය (2) සංයුක්ත තැටිය (3) ටූත්පික් (4) වූල් කටුව

27. පේපර් ක්විලින් ඇසුරෙන් සිදු කළ බිත්ති සැරසිල්ලක් කල් පැවැත්මට හා නිමාවක් ලබා ගැනීමට කළ හැකි සුදුසුම දේ වන්නේ,

(1) වාර්නිෂ් ආලේප කිරීම (2) පොලිතින් උරයක් බහාලීම

(3) රාමු කිරීම (4) අල්මාරියක ගබඩා කිරීම

28. උද්‍යාන අලංකරණ නිර්මාණ කිරීමේ දී ශිල්පියෙකු අවධානය යොමු කළ යුතු උද්‍යාන විද්‍යා මූලධර්මයක් වන්නේ,

(1) අවකාශය (2) සවිවරතාව (3) අනුගමනය (4) පරිමාව

29. උද්‍යාන නිර්මාණ සඳහා මනා නිමාවක් ලබා ගැනීමට වර්ණ ආලේප කළ හැක. ලැකර් වර්ණ දියකර ගැනීමට භාවිතා කළ හැකි මාධ්‍යයක් නොවන්නේ මින් කුමක් ද?

(1) තිනර් (2) ටර්පන්ටයින් (3) භූමිතෙල් (4) ජලය

30. පල්ප හා ප්ලාස්ටර් ඔෆ් පැරිස් මූර්ති වර්ණ ගැන්වීමෙන් පසු, පසු පිරියමක් ලෙස යොදා ගත හැකි ක්‍රමවේදය වන්නේ මින් කුමක් ද?

(1) රෙදි කඩකින් වසා තැබීම (2) අව්වේ වියලා ගැනීම

(3) බයින්ඩර් ගම් ආලේප කිරීම (4) ක්ලියර් වාර්නිෂ් ආලේප කිරීම

31. විවිධ ආකාරයට රෙදි පිළි අලංකරණය කෙරේ. රෙදි පිළි අලංකරණයේ දී ඇප්ලික් ක්‍රමයට සමාන මෝස්තර ලබා ගත හැක්කේ,

(1) බතික් ක්‍රමයටය. (2) පින්තාරු ක්‍රමයටය.

(3) තාප බන්ධිත ක්‍රමයටය. (4) නූල් මුද්‍රණ ක්‍රමයටය.

32. තිර රාමු ක්‍රමය වර්තමානයේ ප්‍රචලිත අලංකරණ ක්‍රමයකි. තිර රාමු ක්‍රමය කිනම් මුද්‍රණ ක්‍රමයක වර්ධනීය අවස්ථාවක් ද?

(1) නූල් මුද්‍රණ ක්‍රමයෙහි (2) ස්වභාවික අච්චු මුද්‍රණ ක්‍රමයෙහි

(3) ස්ටෙන්සිල් ක්‍රමයෙහි (4) කෘත්‍රිම අච්චු ක්‍රමයෙහි

33. තිරරාමු ක්‍රමයේ දී රෙදි පිළි අලංකරණයට බහුලව භාවිතා කරන්නේ කුමන සායම් වර්ගය ද?

(1) පිග්මන්ට් සායම් (2) ලැකර් (3) තෙල් සායම් (4) අවුට්ලයින් තීන්ත

34. බතික් නිර්මාණ සඳහා ඉටි මිශ්‍රණය සාදා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඉටි මිශ්‍රණය සැකසීමට සුදුසුම ක්‍රමවේදය වන්නේ,

(1) පොල් කටු අඟුරු මත මිශ්‍රණය තබා දිය කර ගැනීම

(2) ද්විත්ව උණුසුම් ක්‍රමයට දියකර ගැනීම

(3) අව්වේ තබා දියවීමට සැලැස්වීම

(4) කෙලින්ම ගින්දරට අල්ලා පිලිස්සීමෙන් දියකර ගැනීම

35. ඉටි තැවරීමේ ක්‍රමයක් නොවන්නේ,

(1) ඉටි දියර ආලේපය (2) ඉටි කුට්ටි ආලේපය (3) ඉටි ගල්වා බිඳීම (4) අච්චු භාවිතය

36. රූපයේ දැක්වෙන්නේ නිර්මාණකරුවකු නිර්මාණය කරන ලද ලේන්සුවකි. මෙම නිර්මාණය කිරීමට සායම් පෙවීමේ ක්‍රමයක් ලෙස යොදා ගෙන ඇත්තේ කුමන ක්‍රමයක් ද?



(1) වැට් ඩයි ක්‍රමය

(2) ගැටපඬු ක්‍රමය

(3) බතික් ක්‍රමය

(4) නැප්තෝල් ක්‍රමය

37. නැප්තෝල් වර්ණ යෙදීමේ දී ''මෙරූන් පැහැය'' ලබා ගැනීමට යොදා ගත හැක්කේ,

(1) නැප්තෝල් A.S + රෙඩ් සෝල්ට් B (2) නැප්තෝල් A.S.S. W + බ්ලූ සෝල්ට් B.B

(3) නැප්තෝල් A.S + රෙඩ් සෝල්ට් A.1 (4) නැප්තෝල් A.S.L.B + රෙඩ් සෝල්ට් B

38. බතික් ක්‍රමයේ දී ඉටි ඉවත් කිරීමට අනුගමනය කළ හැකි ක්‍රමයක් නොවන්නේ මින් කුමක් ද?

(1) උණු ජල බඳුනක ගිල් වීම (2) හුමාලයෙන් තැම්බීම

(3) අතින් පොඩි කිරීම (4) කඩදාසියක් නිර්මාණය මත එලා ස්ත්‍රික්ක කිරීම

39. නූල් කිලෝ ග්‍රෑම් එකක මීටර 1000 නූල් කැරලි 30 ක් අඩංගු වේ නම් මෙට්‍රික් ක්‍රමය අනුව එහි අංකය වන්නේ,

(1) $15^{s}$ (2) $30000^{s}$ (3) $300^{s}$ (4) $30^{s}$

40. අංක $10^{s}$ තනිපට නූලක් දෙපට අඹරා ගත් විට එහි අංකය වන්නේ,

(1) $10^{s}$ (2) $5^{s}$ (3) $2/10^{s}$ (4) $15^{s}$

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**11 ශ්‍රේණිය** | **ශිල්ප කලා - II** | කාලය පැය 02 යි

අමතර කියවීම් කාලය මිනිත්තු 10

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :
- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක්ද, තෝරා ගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

(01) ග්‍රාමීය මට්ටමේ රැකියා විරහිත කාන්තාවන්ගේ ආර්ථිකය නගා සිටුවීමේ අරමුණ පෙරදැරිව පාරම්පරික ගෘහ කර්මාන්ත සහ ඒ ආශ්‍රිත නිර්මාණ පිළිබඳ පුහුණු වැඩමුළුවක් සහ ප්‍රදර්ශනයක් ග්‍රාමීය මට්ටමින් රටපුරා පැවැත්වීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සූදානම් කර තිබුණි.

(i) මෙම වැඩසටහන සඳහා ඔබ යෝජනා කරන පාරම්පරික ගෘහ කර්මාන්ත හතරක් නම් කරන්න.

(ii) මෙම වැඩසටහන සඳහා තේමා පාඨයක් ඉදිරිපත් කරන්න.

(iii) ආරාධිත අමුත්තන් සඳහා ඇරයුම් කිරීමට ආරාධනා පත්‍රයක් සකස් කළ යුතු විය. එහි අඩංගු විය යුතු අත්‍යාවශ්‍ය අංග මොනවාද?

(iv) සාම්ප්‍රදායික පොල්තෙල් පහන වෙනුවට යොදාගත හැකි පොල්තෙල් පහනක් සකස් කිරීමට ගත හැකි දේශීය මල් හා කොළ වර්ග 2 බැගින් ලියන්න.

(v) අමුත්තන් පිළිගැනීම හා කැඳවාගෙන යන නැටුම් කණ්ඩායමේ ඇඳුම අලංකාර කර ගැනීම සඳහා අච්චු මුද්‍රණ ක්‍රමයට සුදුසු මෝස්තරයක් අඳින්න.

(vi) ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කළ හැකි රෙදි ආශ්‍රිත ගෘහ අලංකරණ දෙකක් නම් කරන්න.

(vii) ප්‍රදර්ශනය නැරඹීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීමට තීරණය විය. මෙම ප්‍රවේශ පත්‍රය සඳහා සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.

(viii) පන් ආශ්‍රිත නිර්මාණය කළ හැකි අලෙවිය සඳහා ඉදිරිපත් කළ හැකි නිර්මාණ හතරක් නම් කරන්න.

(ix) ආභරණ සකස් කර ගැනීම සඳහා යොදාගත හැකි මාධ්‍ය 04 ක් නම් කරන්න.

(x) ඝන ජ්‍යාමිතිය සඳහා උදාහරණ 02 ක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) අත්යන්ත්‍රයක ආධාරයෙන් අත්පිස්නාවක් වියා ගැනීම සඳහා සකස් කරන ලද නූල් හැදයක දළ රූපසටහනක් පහතින් දැක්වේ.




* හැදයේ දිග - 20 m
* හැදයේ පළල - 40 cm
* දිග සෙන්ටිමීටරයට නූල් පොටවල් ගණන - 60
* නූලේ නොම්මරය - 2/40$^{s}$
* නූලේ වර්ණය - කහ

(i) මෙම අත්පිස්නා වියා ගැනීමට සුදුසු වියමන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන් එක් වියමන් රටාවක් ඇඳ දක්වන්න. (ලකුණු 04)

(iii) හැදය සඳහා අවශ්‍ය දික්නූල් පොටවල් ගණන ගනණය කරන්න. (ලකුණු 04)

(03) අත්කම් නිර්මාණ අලංකාර ලෙස නිර්මාණය කිරීමට ජ්‍යාමිතික හැඩතල උපකාරී වේ.

(i) ජ්‍යාමිතික හැඩතල නිර්මාණය සඳහා යොදා ගන්නා පහත සඳහන් උපකරණවලින් කෙරෙන කාර්යය බැගින් ලියන්න.

1. කවකටුව 2. කෝණමානය (ලකුණු 02)

(ii) පහත දැක්වෙන ත්‍රිකෝණ නිර්මාණය කරන්න.

1. සුළු කෝණී විෂමපාද ත්‍රිකෝණය

2. මහා කෝණී ත්‍රිකෝණය (ලකුණු 04)

(iii) පාදයක දිග 5cm ක් හා පළල 3cm ක් වන සෘජුකෝණාස්‍රය නිර්මාණය කරන්න. (ලකුණු 04)

(04) රෙදිපිළි නිෂ්පාදනය සඳහා ස්වභාවික මෙන්ම කෘත්‍රිම කෙඳි යොදා ගනී.

(i) කෙඳි ලබා ගැනීමට යොදා ගන්නා ශාක වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 02)

(ii) හීරි වියමනේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉහත නම් කරන ලද වියමන් අතරින් ඔබ කැමති එක් වියමන් රටාවක් අඳින්න. (ලකුණු 04)

(05) ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල මැටි නිධි පිහිටා ඇත. මැටි යොදා ගනිමින් විවිධ නිර්මාණ සිදුකරයි.

(i) 

රූප සටහනේ දැක්වෙන මැටි බඳුන් නිර්මාණය සඳහා යොදා ගෙන ඇති නිර්මාණ ක්‍රමය නම් කරන්න. (ලකුණු 02)

(ii) මැටි දරණු මගින් මැටි භාණ්ඩ සෑදීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් ලියන්න.(ලකුණු 04)

(iii) සකපෝරුවක මැටි භාණ්ඩ ඉදිකිරීමේ පියවර අනුපිළිවෙලින් ලියන්න. (ලකුණු 04)

(06) රෙදිපිළි අලංකරණය සඳහා විවිධ ක්‍රම භාවිතා කරයි.

(i) රෙදි පිළි වර්ණ ගැන්වීම සඳහා යොදා ගන්නා මූලික වර්ණ නම් කරන්න. (ලකුණු 02)

(ii) බතික් මුද්‍රණ ක්‍රමයේ දී ඉටි රෙද්ද මත තැවරීමෙන් මෝස්තර මැවීමේ ක්‍රමය සිදු කරයි. ඉටි රෙද්ද මත තැවරීම සඳහා යොදා ගන්නා ක්‍රම හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඔබ කැමති එක් රෙදි පින්තාරු ක්‍රමයක් නම් කර එය යොදා ගනිමින් ලේන්සුවක් නිර්මාණය කරගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

(07) උද්‍යාන අලංකරණය විවිධ මාධ්‍ය භාවිතයෙන් සිදු කරයි.

(i) උද්‍යාන අලංකරණය සඳහා භාවිතා කළ හැකි මාධ්‍ය 04 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) උද්‍යාන අලංකරණ නිර්මාණය කිරීමේ දී ශිල්පියකු විසින් අවධානය යොමු කළ යුතු උද්‍යාන විද්‍යා මූලධර්ම හතරක් නම් කර විස්තර කරන්න. (ලකුණු 04)

(iii) ඔබ කැමති මාධ්‍යයක් භාවිතයෙන් බිතු කැටයමක් සකස් කරගන්නා ආකාරය විස්තර කරන්න.

(ලකුණු 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 4) | 02. (3 ) | 03. ( 2) | 04. (3 ) | 05. ( 1 ) | 06. ( 1) | 07. ( 2 ) | 08. ( 3 ) | 09. ( 2) | 10. ( 4) |
| 11. (2 ) | 12. ( 2 ) | 13. ( 3) | 14. ( 4) | 15. ( 2 ) | 16. ( 1 ) | 17. ( 4 ) | 18. ( 2 ) | 19. ( 2) | 20. ( 3) |
| 21. (3 ) | 22. ( 2) | 23. ( 1) | 24. ( 2) | 25. ( 4 ) | 26. ( 3 ) | 27. ( 3 ) | 28. ( 1 ) | 29. ( 4) | 30. ( 4) |
| 31. (3 ) | 32. ( 3 ) | 33. ( 1) | 34. ( 2) | 35. ( 2 ) | 36. ( 2) | 37. ( 1 ) | 38. ( 3 ) | 39. ( 4) | 40. ( 3) |

## II පත්‍රය

(01) (i) ලාක්ෂා කර්මාන්තය, පිත්තල කර්මාන්තය, පේෂ කර්මාන්තය, මැටි කර්මාන්තය වැනි කර්මාන්ත හතරක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(ii) සුදුසු තේමා පාඨයකට ලකුණු දෙන්න. ''දිරියෙන් පෙරට'' , ''කාන්තා සවිය''

(iii) දිනය, වේලාව, ස්ථානය යනාදී කරුණු

(iv) මල් - ඇන්තූරියම්, රෝස, අරලිය, වැනි
කොළ - ක්‍රෝටන්, ෆර්මිස්, කිතුල්, ගොක්කොළ

(v) සුදුසු මෝස්තරයකට ලකුණු ලබා දෙන්න.

(vi) පාපිසි, බඳුන් පලස්, බිත්ති සැරසිලි කුෂන් කවර යනාදිය

(vii) සුදුසු ලාංඡනයක් නිර්මාණය කර ඇත්නම් ලකුණු දෙන්න.

(viii) පැදුරු, වට්ටි, පෙට්ටි, තොප්පි යනාදිය

(ix) මැටි, කඩදාසි, ගල් යනාදිය

(x) ඝනකාභය, ඝනකය, සිලින්ඩරය, ප්‍රිස්මය යනාදිය (ලකුණු 2 X10)

(02) (i) චාම් වියමන ජටා වියමන සරල හීරි වියමන යනාදී වියමන් (ලකුණු 2)

(ii) වියමන් රටාව නිවැරදිව ඇඳීමට ලකුණු දෙන්න. (ලකුණු 4)

(iii) සෙ.මී. ඇති දික් නූල් සංඛ්‍යාව X හැදයේ පළල
60x 40 = 2400 (ලකුණු 4)

(03) (i) වෘත්තාකාර හැඩ ඇඳීම / වක්‍ර රේඛා ඇඳීම කෝණ නිර්මාණය චාප ඇඳීම

(ii) කෝණ මැනීම, සලකුණු කිරීම (ලකුණු 2)

මහා කෝණී ත්‍රිකෝණය



සුළු කෝණී ත්‍රිකෝණය



(iii) නිර්මාණය කරන ලද ඍජුකෝණයට ලකුණු දෙන්න.
(කවකටු, විහිත චතුරස්‍ර, අඩිරූල භාවිතයෙන් කරන ලද නිර්මාණ සඳහා පමණක් ලකුණු දෙන්න.)

(04) (i) කපු, ලිනන්, නියඳ, රැමී , ජූට්

(ii) සරල හීරි, දඟර හීරි, තුඩු හීරි, රැචිත හීරි, කඩ හීරි, සංයෝජන හීරි, විසිතුරු හීරි (ලකුණු 4)

(iii) අඳින ලද නිවැරදි වියමන් රටාවට ලකුණු දෙන්න. (ලකුණු 4)

(05) (i) මැටි තහඩු ක්‍රමය (ලකුණු 2)

(ii) හොඳින් පදම් කළ මැටි භාවිතය
සමාන ඝනකම සහිත දරණු සකස් කිරීම
දරණු සම්බන්ධ කිරීමේ ද කඩතොළු කිරීම
මැටි පාප්ප මගින් දරණු සම්බන්ධ කිරීම
කඩතොළු රහිතව දරණු සකස් කර ගැනීම (ලකුණු 4)

(iii) 1. පදම් කළ මැටි සකපෝරුවේ සවි කිරීම
2. මැටි පිඩ මධ්‍යගත කිරීම
3. වයනය ලබා ගැනීම
4. මැටි පිඩ විවෘත කිරීම
5. බඳුනේ පතුල නිසි පරිදි සකස් කිරීම
6. බඳුනේ බිත්ති ඉහළට එසවීම
7. බඳුනේ කට නිම කිරීම
8. සකපෝරුවෙන් බඳුන ඉවත් කිරීම
9. නිමහන් කිරීම (ලකුණු 4)

(06) (i) රතු, කහ, නිල්

(ii) ඉටි දියර ආලේපය කිරීම, ඉටි ඉසීම, ඉටි ගල්වා ඉටි බිඳීම, අච්චු භාවිතයෙන් ඉටි ගැල්වීම (ලකුණු 4)

(iii) නිවැරදිව පින්තාරු කරගන්නා ආකාරය සඳහන් කර ඇත්නම් ලකුණු දෙන්න. (අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ නම් කිරීම, සකස් කරගන්නා පියවර නම් කිරීම.) (ලකුණු 4)

(07) (i) සිමෙන්ති, මැටි, ප්ලාස්ටර් ඔෆ් පැරිස්, ලෝහ කළුගල්, දැව

(ii) අවකාශය - සුදුසු ස්ථානයක් තෝරා ගැනීම
සම්පිණ්ඩනය - හැඩතලවල සම්පිණ්ඩනය
අනුපාතය - හැඩතල වල පරිමාව නියමිත ප්‍රමාණවලට යොදා ගැනීම
විවිධත්වය - නිර්මාණයේ විවිධ බව
නිමාව - නිර්මාණයේ අවසාන නිමහම් ලක්ෂණ (ලකුණු 4)

(iii) ලියන ලද නිවැරදි පිළිතුරකට ලකුණු දෙන්න, අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ, සකස් කර ගන්නා ආකාරය පියවර අනුව ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 4)